## පළමුවන කියැවීම

ද්විතීය නීති සංග්‍රහය 26:4-10

ද්විතීය නීති සංග්‍රහය නමැති පොතෙන් ගත් පාඨයෙකි.

**"දේව ජනකායේ විශ්වාසය"**

පූජකවරයා ද පැස ඔබේ අතින් ගෙන දෙවි සමිඳාණන් වහන්සේගේ පූජාසනය ඉදිරිපිට එය තැබිය යුතු ය. ඉන්පසු ඔබ දෙවි සමිඳාණන් වහන්සේ ඉදිරිපිට මෙසේ කිව යුතු ය: 'මාගේ ආදි පියා තැනින් තැන සංචාරය කළ අරමීය ජාතිකයෙකි. ඔහු කුඩා පිරිසක් කැටුව මිසරයට ගොස්, එහි කලකට පදිංචි වී මහත් බලසම්පන්න, ගණනින් විශාල ජාතියක් විය. මිසරවාසීහු ද නපුරු ලෙස ක්‍රියා කරමින්, අපට හිංසා පීඩා කොට අප දැඩි වහල්කමට පත් කළහ. අපේ ආදි පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට අප මොරගැසූ විට සමිඳාණන් වහන්සේ අපට සවන් දී අපේ දුක් කරදර ද හිංසා පීඩා ද වෙහෙස මහන්සි ද දෙස බැලූ සේක. සමිඳාණන් වහන්සේ සිය හස්තය දිගු කොට, බාහු බලය පා, බියජනක අරුමපුදුම දේවලින් සහ හාස්කම්වලින් මිසර දේශයෙන් අප පිටතට ගෙනා සේක. උන් වහන්සේ අප මෙහි ගෙනවුත්, කිරෙන් සහ මී පැණියෙන් ඉතිරෙන මේ දේශය අපට දුන් සේක. සමිඳුනි, දැන් බලනු මැනව; ඔබ මට දුන් දේශයේ නාඹුල් පල මම ගෙනැවිත් සිටිමි.' මෙසේ කියා දෙවි සමිඳාණන් ඉදිරියෙහි එය තබා උන් වහන්සේට නමස්කාර කළ යුතු ය."

දේව වාක්‍යය එසේ ය.     දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 91:1-2, 10-15

පිළිතුර: සමිඳුනි, මාගේ දුකේදී මා සමග සිටිය මැනව.

ගීය: පරමෝත්තමයාණන්ගේ රැකවරණයෙහි වසන තැනැත්තේ, සර්ව බලැති දෙවිඳුන්ගේ සරණෙහි සුරැකි වන්නේ ය. ඔහු සමිඳුන්ට මෙසේ පවසයි: "එතුමාණෝ මාගේ රැකවරණය ය. මාගේ බලකොටුව ය. මාගේ දෙවිඳාණෝ ය. මම එතුමන් කෙරෙහි මාගේ විශ්වාසය තබන්නෙමි."

එවිට ඔබට කිසි උවදුරක් නොවන්නේ ය. ඔබේ නිවෙසට කිසියම් වසංගතයක් ළං නොවන්නේ ය. ඔබ ගන්න සෑම පියවරක දී ඔබ රක්නා පිණිස, එතුමාණෝ සිය දූතයන්ට අණ දෙන සේක.

ඔබ දෙපා ගල්වල නොහැප්පෙන පිණිස, ඔව්හු සිය'තින් ඔබ උසුලාගන්නෝ ය. ඔබ, සිංහයෙකු වුවත්, සර්පයෙකු වුවත් පාගන්නෙහි ය. ඔබ කේශර සිංහයෙකු වුවත්, මකරෙකු වුවත් පාගා දමන්නෙහි ය.

සමිඳාණෝ මෙසේ වදාරන සේක: "ඔහු මට ප්‍රේම කරන්නේ නම්, මම ඔහුට විමුක්තිය දෙන්නෙමි. ඔහු මාගේ නාමය පිළිගන්නේ නම්, මම ඔහු රැකගන්නෙමි. ඔහු මට අයැදින්නේ නම්, මම පිළිතුරු දෙන්නෙමි. දුකේ දී ඔහු සමඟ සිට ඔහු මුදා මම ඔහුට ගරු කරන්නෙමි.

## දෙවන කියැවීම

රෝම 10:8-13

ශුද්ධ වූ පාවලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**"ක්‍රිස්තියානි ජනතාවගේ විශ්වාසය."**

එයින් තව කුමක් පැවසේ ද? පැවසෙන්නේ: "වාක්‍යය ඔබේ මුවෙහි ය, ඔබේ සිතෙහි ය, ඔබ ළඟ ම ය" කියා ය. ඒ වාක්‍යය අප ප්‍රකාශ කරන ඇදහිල්ලේ පණිවුඩය වේ. ඔබ 'ජේසුස් වහන්සේ සමිඳාණන් වහන්සේ ය'යි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නෙහි

නම්, දෙවියන් වහන්සේ උන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ බව සිතින් අදහන්නෙහි නම්, ඔබ ගැළවීම ලබන්නෙහි ය. මනුෂ්‍යයෙක් සිතින් ඇදහීමෙන් දේව සබඳතාවට පැමිණෙන්නේ ය. මුවින් පැවසීමෙන් ගළවනු ලබන්නේ ය. "උන් වහන්සේ අදහන කිසිවෙක් ලජ්ජාවට නොපැමිණෙති"යි ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් ව ඇත. ජුදෙව්වා හා ග්‍රීකයා අතර වෙනසක් නැත. එක ම ස්වාමින් වහන්සේ සියල්ලන්ගේ ම ස්වාමින් වහන්සේ ය. උන් වහන්සේගේ පිහිට අයැදින සියල්ලන්ට උන් වහන්සේ සියලු යසඉසුරු සලසා දෙන සේක. මන්ද: " ස්වාමින් වහන්සේගේ නාමය කියා අයැදින කවරෙක් නමුත් ගැළවීම ලබති"යි ශුද්ධ ලියවිල්ලෙහි කියා ඇත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ලූක් 4:4

'මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව
දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචනවලින් ය' යි
ස්වාමින් වහන්සේ වදාළ සේක.

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 4:1-13

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ආත්මයාණන් විසින් පාළුකරයට ගෙනයනු ලැබූ ක්‍රිස්තුස්වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂා කරන ලදී.**

ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් පූර්ණ ව ජොර්දනෙන් ආපසු ආ විට, ආත්මයාණන් වහන්සේ විසින් උන් වහන්සේ පාළුකරයට ගෙනයනු ලැබූ සේක. එහි දී දින සතළිසක් මුළුල්ලේ යක්ෂයා උන් වහන්සේ පරීක්ෂා කෙළේ ය. ඒ දවස්වල දී උන් වහන්සේ කිසිවක් නොවැළඳූ සේක. ඒ කාලය නිම වූ පසු උන් වහන්සේට කුසගිනි ඇති විය. එකල යක්ෂයා කතා කරමින්, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්, මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනවැ"යි උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්," 'මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ ය' කියා ලියා ඇතැ"යි ඔහුට වදාළ සේක. එවිට යක්ෂයා උන් වහන්සේ උස් තැනකට පමුණුවා, ක්ෂණයකින් ලෝකයේ සියලු රට රාජ්‍යයන් උන් වහන්සේට පෙන්වා, "මේවා කෙරෙහි මුළු ආධිපත්‍යය ද ඒවායේ යස ඉසුරු ද ඔබට දෙන්නෙමි. ඒවා මට පවරා දී ඇති හෙයින් මා කැමැති කෙනෙකුට ඒවා දෙමි. එබැවින් ඔබ මා ඉදිරියෙහි නමස්කාර කරන්නෙහි නම් ඒ සියල්ල ම ඔබ සන්තක වන්නේ ය"යි උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, " 'නුඹේ දෙවි වන ස්වාමින් වහන්සේට නමස්කාර කරන්න. උන් වහන්සේට පමණක් සේවය කරන්න' කියා ලියා ඇතැ"යි ඔහුට වදාළ සේක. ඉන්පසු ඔහු උන් වහන්සේ ජෙරුසලමට ගෙන ගොස්, දේව මාලිගාවේ කොත මුදුනේ සිටුවා, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතැනින් පහතට පනින්න. එසේ කියන්නේ, 'ඔබට රැකවරණ සලසනු වස් උන් වහන්සේ සිය දූතයන් හට අණ දෙනු ඇතැ'යි ද 'යම් ලෙසකින් ඔබේ පය ගලක නොවදින පිණිස ඔවුන් සිය දෝතින් ඔබ උසුලනු ඇතැ'යි ද කියා ලියා ඇති බැවිනැ"යි උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, " 'නුඹේ දෙවි වන ස්වාමින් වහන්සේ පරීක්ෂා නොකරන්න,' කියා ද ලියා ඇතැ"යි වදාළ සේක. යක්ෂයා මෙකී පරීක්ෂා නිමවා, සුදුසු අවස්ථාවක් යළිත් එළඹෙන තුරු උන් වහන්සේ අත්හැර ගියේ ය.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.